# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: ස.සං.දෙ/බැංකු/2/4/9

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.12. 29

මුදුන් මට්ටමේ මුල්‍ය සේවා සමුපකාර සමිති / සංගම්වල

ගරු සභාපතිවරුන් වෙත,

<u>" ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ බලපත්‍රය අවලංගු කිරීම</u>

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මුල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022.12.28 වන දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයහි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි.

02. ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී මුල්‍ය ආයතනයට මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ලබා දී තිබූ බලපත්‍රය 2022.12.28 වන දින සිට අවලංගු කර ඇති හෙයින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ උපරිමය රු.1,100,000.00 රක්ෂණ වන්දිය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආදේශයන් ඉදිරිපත් කරන මෙන් එම සමාගමේ මුදල් තැන්පත් කර ඇති සමුපකාර මුල්‍ය සේවා සමිතියට දැන්වීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03. තවද, මෙම සමාගම නමින් නියෝජිතයන් ලෙස පෙනී සිටින පුද්ගලයන් වෙත මුදල් ගනුදෙනු සිදු නොකරන ලෙස සියළුම මුල්‍ය සේවා සමිති දැනුවත් කල යුතු බවද විශේෂයෙන් සිහිපත් කරමි.

**ජී. ජී. දයාසුමන**
නියෝජ්‍ය කොමසාරිස්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙනුවට

# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ: බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
දිනය: 2022.12.28


## "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධව

"ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනය වෙත **මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය, 2022 දෙසැම්බර් 28 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීමට** ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 37(3) වගන්තිය ප්‍රකාරව තීරණය කරන ලදී. ඒ අනුව "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයට **2022 දෙසැම්බර් 28** දින සිට මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ, මුදල් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට අවසර නොමැත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින්, "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනය වෙත 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ලබා දී තිබූ **ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීමට** තීරණය කර ඇත.

"බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්ම" සම්බන්ධයෙන් නිකුත් කල නියෝගවලට අනුකූලව එස්.එම්.බී. ෆයිනෑන්ස් පීඑල්සී" (එවකට එස්.එම්.බී ලීසිං පීඑල්සී) ආයතනය විසින් "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ තැන්පතු නැවත ගෙවීම සඳහා දැක්වූ දායකත්වය මත "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයෙහි හිමිකම් නොපෑ තැන්පතු වගකීම් ඊට අනුරූපී වත්කම් සහ අදාළ තැන්පතුකරුවන්ගේ තොරතුරු සමඟ "එස්.එම්.බී. ෆයිනෑන්ස් පීඑල්සී" ආයතනය වෙත පවරනු ඇත.

තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය ඔස්සේ එහි පවතින රෙගුලාසීන්ට අනුකූලව එහි රක්ෂණය වී ඇති තැන්පතුකරුවන් විසින් තවමත් ලබා නොගත් රක්ෂණ වන්දි මුදල්, රු 1,100,000/-ක උපරිමයකට යටත්ව ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ඇත. "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ තවමත් හිමිකම් ලබානොගත් තැන්පතු වගකීම් "එස්.එම්.බී. ෆයිනෑන්ස් පීඑල්සී" ආයතනය වෙත පැවරීමෙන් සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය ඔස්සේ ඉතිරි රක්ෂණ වන්දි මුදල් ගෙවීමෙන් පසු, "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ සමස්ත තැන්පතු වගකීම ශුන්‍ය වනු ඇත.

වැඩිදුර විමසීම් සඳහා:

| ආයතනය | අරමුණ | දුරකථන අංක | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව- බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධව විමසීම් සඳහා | 011 2477504 | snbfi_query@cbsl.lk |
| ශ්‍රී ලංකා මහ බැංකුව- නිරාකරණය හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව | තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ මුදල් ගෙවීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2398788 | dred@cbsl.lk |
| ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනය | හිමිකම් නොලැබූ තැන්පතු සම්බන්ධ කරුණු විමසීම සඳහා | 011 7534800 | info@sfs.lk |